අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. } ED/04/59/04/05/20

ඔබේ යොමුව / உமது இல. / Your Ref. }

දිනය / திகதி / Date } 2024.09. 25

ලේඛකාධිකාරි

........................................ විශ්වවිද්‍යාලය

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම විවෘත 2019 (2020)**

අංක 1925/37 හා 2015.07.28 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවෙහි අංක 2141/73 හා 2019.09.19 දිනැති ගැසට් පත්‍රයේ පල කර ඇති සංශෝධනය අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III ශ්‍රේණිය සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නියමිත ය.

02. එහිදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ, ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල අධ්‍යයන කාර්යයන්වලට අදාළ විෂයයන් 35ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට නියමිත ය. එහිදී අයදුම්කරුවන් තමන් අයදුම් කරනු ලබන විෂය ධාරාව ප්‍රධාන විෂයයන්ගෙන් එකක් ලෙස උපාධියට හදාරා තිබීම අත්‍යවශ්‍ය වන අතර, උපාධිය සඳහා හදාරන ප්‍රධාන විෂය ඒකක ( සම්භාර ) සංඛ්‍යාවෙන් තුනෙන් එකක්වත් (1/3) අයදුම් කරන විෂයට අදාළ වන විෂයයක් විය යුතු ය. එසේම ඒ බව උපාධිය පිරිනමනු ලබන විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී මඟින් තහවුරු කර තිබිය යුතුය. ඉහත තහවුරු කිරීමේ සහතිකය සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු බැවින් එම සහතිකය සම්මුඛ පරීක්ෂණයට පෙර අයදුම්කරුවන් විසින් අදාළ විශ්වවිද්‍යාලය වෙතින් ලබා ගත යුතු වේ.

03. ඒ අනුව මේ සමඟ අමුණා ඇති ඇමුණුම 01 ආකෘතියට අනුව එම අයදුම්කරුවන් විසින් අදාළ තොරතුරු ඉල්ලුම් කරනු ඇති අතර අදාළ තොරතුරු කඩිනමින් ලබාදීමට කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

04. මෙ සම්බන්ධයෙන් ඔබ විසින් දක්වනු ලබන සහය ගෞරව පූර්වකව අගය කරමි.

ආචාර්ය කේ.පී. මුනගම
අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන)


ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister } +94112784832 / +94112784825 / minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary } +94112784811 / +94112785162 / secretary.education@moe.gov.lk